# හිතු මනාපෙට ප්‍රතිජීවක ඖෂධ බොන්න කලින් මේ ලිපිය කියවන්න

ලෝක සෞඛ්‍ය සංවිධානය සෑම වසරකම සංවිධාන කරන ප්‍රතිජීවක ඖෂධ අවභාවිතය පිළිබඳව ලෝක ජනතාව දැනුවත් කිරීමේ සතිය නොවැම්බර් මස 18 වැනි දින සිට 24 වැනි දින දක්වා පැවැත්වේ. මෙම ලිපිය ඒ නිමිත්තෙනි.

අපට ආසාදන ඇති කරන බැක්ටීරියාවන්ට විරුද්ධව අප විසින් දෙනු ලබන ඖෂධ, ප්‍රතිජීවක ඖෂධ ලෙස හැඳින්වේ. විවිධාකාර අවස්ථාවන්හිදී අපට රෝග ඇති කරන අහිතකර බැක්ටීරියා විනාශ කිරීමට ප්‍රතිජීවක අවශ්‍ය වේ. විශේෂයෙන්ම මෙම ප්‍රතිජීවක අනෙකුත් ආසාදන තත්ත්වයන්ට එනම් වයිරස, දිලීර සහ පරපෝෂිතයන්ගෙන් ඇතිවන ආසාදනයකට ලබාදිය යුතු නොවන, බැක්ටීරියා සඳහා පමණක් භාවිත කළ යුතු ඖෂධ කාණ්ඩයකි.

බැක්ටීරියා ආසාදන නිසා අතීතයේ මිලියන ගණනකගේ ජීවිත නැති විය. ආයු කාලය ඉතා අඩු විය. පසුව 1928දී පමණ පෙනිසිලින් සොයා ගනු ලැබිණි. එතැන් පටන් ප්‍රතිජීවක ඉතා ක්‍රමිකව විකාශය විය. එක් එක් වර්ගයන්ගෙන්, එක් එක් කාණ්ඩවල ප්‍රතිජීවක නිර්මාණය විය. ඒ අවධියේදී බැක්ටීරියාවක ව්‍යුහය හොඳින් අධ්‍යයනය කරනු ලැබිණි. බැක්ටීරියාවක සෛල බිත්තියක් තිබේ. සෛල මාධ්‍යයක් තිබේ. ජානමය ද්‍රව්‍ය ඇතුළත් කොටසක් තිබේ. ප්‍රතිජීවක නිර්මාණය කරගෙන යන විට විවිධ පර්යේෂණ සිදු කරමින් සෛල බිත්තිය සඳහා ප්‍රතිජීවක, ජානමය ද්‍රව්‍ය නිර්මාණය වළකන ප්‍රතිජීවක සහ ඔවුන්ගේ පරිවෘත්තීය ක්‍රියාකාරකම් නතර කළ හැකි ප්‍රතිජීවක ආදී වශයෙන් බොහෝ වපසරියක් පුරා විකාශය වූ විශාල කාණ්ඩ ගණනක් නිර්මාණය විය. පෙනිසිලින්වල සිට එය ක්‍රමිකව ඉදිරියට විකාශය විණි. එයත් සමඟව මිනිසුන්ගේ ආයු අපේක්ෂාව ඉහළ ගියේය. නමුත් මිනිසුන් මෙය දිගින් දිගටම භාවිතයට ගැනීමට පුරුදු විය. මෙම බැක්ටීරියාද විවිධ කාණ්ඩ නිර්මාණය කරමින් ඉදිරියට පැමිණීම නිසා අපට නව ප්‍රතිජීවක නිර්මාණය කිරීමටද සිදුවිය.

අවසාන වශයෙන් නව ප්‍රතිජීවක කාණ්ඩයක් නිර්මාණය කරනු ලැබුවේ දශක තුනක කාලයකට පෙරය. එතැන් පටන් අලුතින් ප්‍රතිජීවක කාණ්ඩයක් නිර්මාණය කර ගැනීමට අපට නොහැකි වී තිබේ. ප්‍රතිජීවක හරහා අපට ලැබෙන පිහිට අඩුවී ගෙන යන බවත් අපට පෙනෙන්නට ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් පුරෝකථන කර ඇත්තේ වර්ෂ 2050 පමණ වනවිට සාමාන්‍යයෙන් අපට සෑදෙන ලෙඩ රෝග සියල්ලටම වඩා වැඩි ප්‍රමාණයක් ප්‍රතිජීවක ඖෂධවලට ප්‍රතිරෝධී බැක්ටීරියා ආසාදනය වීම නිසා මිනිසුන් මිය යන බවයි. විවිධ වර්ගවලින් ප්‍රතිජීවක තිබුණත් ඒවා භාවිත කිරීම කළ නොහැකිය. එයට හේතුව බොහෝ බැක්ටීරියා ඒවාට ප්‍රතිරෝධී වීමයි.

ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ප්‍රතිජීවක ඖෂධ පිළිබඳව දැනුවත් කිරීමේ සතියක් සෑම අවුරුද්දකම නම් කරනු ලබයි. වර්ෂ 2015දී මෙම ප්‍රතිජීවක පිළිබඳ ගැටලුව හඳුනාගෙන ඒ පිළිබඳව දැනුවත් කිරීමේ සතියක් ආරම්භ කෙරිණි. මෙය මුල් කාලයේ හැඳින්වූයේ ප්‍රතිජීවක දැනුවත් කිරීමේ සතිය ලෙසිනි. වසර 2020 දක්වාම Antibiotic Awareness Week තේමාව යටතේ මෙය පවත්වන ලදී. 2020 වසරෙන් පසුව ප්‍රතික්ෂුද්‍රජීව දැනුවත් කිරීමේ සතිය (Word Antimicrobiotic Awareness Week) ලෙස හැඳින්විණි. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් මෙම සතිය සඳහා “ප්‍රතික්ෂුද්‍රජීව ඖෂධ ප්‍රවේශමෙන් පරිහරණය කරමු” යනුවෙන් මූලික තේමාවක් හඳුන්වාදී තිබේ. මීට අමතරව වසරක් පාසා එම වසරට අදාළ තේමාවක්ද ඔවුන් විසින් හඳුන්වාදී ඇත. ප්‍රධාන තේමාව ඒ ආකාරයෙන් පවතිද්දී වසරක් පාසා නව තේමාවක් ඔවුන් විසින් ප්‍රකාශයට පත් කරනු ලබයි. මෙවර එම සතියේ තේමාව වන්නේ “Prevent Antibiotic Resistance Together” (ප්‍රතිජීවක ප්‍රතිරෝධය එක්ව වළකමු) යන්නයි. Together යන කාරණය තුළ කොටස් තුනක් ඇතුළත්ය. එක් කොටසක් වෛද්‍ය ක්ෂේත්‍රයයි. දෙවැනි කාණ්ඩය පශු වෛද්‍ය කොටසයි. එම කොටස තුළත් ප්‍රතිජීවක



**මහාචාර්ය ලක්මිණී විජේසූරිය**
**විශේෂඥ වෛද්‍ය, වෛද්‍ය පීඨය**
**කැලණිය විශ්වවිද්‍යාලය**

ඖෂධ භාවිත වීම දක්නට ලැබේ. තෙවැනි කොටස වන්නේ කෘෂිකර්මාන්තයයි. සතුන්ගෙන් වගාව ආරක්ෂා කර ගැනීම සඳහා මෙම ප්‍රතිජීවක ඖෂධ භාවිත කරනු ලබයි.

ජීවියකු වශයෙන් අප තුළ, අපේ සම මත, එසේම අපේ ශරීරයේ බාහිර පරිසරයට නිරාවරණය වන පද්ධති සෑම දෙයකම ක්ෂුද්‍රජීවීහු විශාල ප්‍රමාණයක් වාසය කරති. පරිණාම ක්‍රියාවලියත් සමඟම අපි ඔවුන් සමඟින් පැමිණ ඇත. ඔවුන් අපිට හිතකරය. ඔවුහු අපිට ආරක්ෂාව ලබා දෙති. අපේ ශරීරයේ සිටින මොවුන් ක්ෂුද්‍රජීවී ගහනයක් ලෙස හැඳින්වේ. ප්‍රතිශක්තිය කියන කාරණය අපට ආකාර 2කින් ලැබේ. එක් ආකාරයක් නම් එය අප උපතින් රැගෙන එන ප්‍රතිශක්තියයි.

දෙවැනි ආකාරය නම් පසුකාලීනව අප අත්පත් කර ගන්නා ප්‍රතිශක්තියයි. උපතේ සිට අප සමඟ පවතින ප්‍රතිශක්තියේ එක් කොටසක් ලෙස මෙම ක්ෂුද්‍ර ජීව ගහනය හැඳින්විය හැකියි. ප්‍රතිජීවක ඖෂධ ලබා දෙන්නේ බැක්ටීරියා ආසාදනයක් ඇති වුණු විටකදීය. නමුත් ඒ නිසා රෝගයට හේතු වන බැක්ටීරියාව වගේම අපේ ශරීරයට හිතකර බැක්ටීරියා යන කොටස් 2කම විනාශ වේ.

ප්‍රතිජීවක ඖෂධ අවභාවිතය යටතේ මිනිසුන් ඖෂධසල්වලින් පැරණි බෙහෙත් වට්ටෝරුවකට බෙහෙත් ලබාගනු ලබයි. සතුන්ට බෙහෙත් ලබා දෙන විටත් එය සිදු කිරීම අපට දක්නට ලැබේ. සතුන්ට ඖෂධ ලබාදීමේදී ඔවුන්ගේ ශරීර තුළින් ප්‍රතිරෝධී බැක්ටීරියා ඇති කරගනු ලබයි. සතුන්ගේ අපද්‍රව්‍ය සමඟ මේ සියල්ල ජලයට එකතු වේ. ඒවා ගංගාවලට, ඇළවලට, වැව්වලට යන සෑම ස්ථානයක ගමන් කරයි. ඒ තැන්වල සිටින මත්ස්‍ය කාණ්ඩයන් තුළ ගහනයක් නිර්මාණය කරගනු ලබයි. කෘෂි කර්මාන්තයේදී දිලීරනාශක වැනි දේවල් භාවිත කරනවා අපිට දක්නට ලැබේ.

මේ සියල්ල එක දැලක් ආකාරයට බැඳී තිබෙන අතර ‘One Health Concept’ යනුවෙන් හඳුන්වනු ලබන්නේ එයයි. මත්ස්‍ය වගාවන්වලදී මාළු විශාල ප්‍රමාණයක් කුඩා ඉඩක බෝ කරනු ලබයි. ඒ සඳහාත් ප්‍රතිජීවක ඖෂධ භාවිත කරයි. බොහෝවිට රෝගවලට ගොදුරුවෙයි යන උපකල්පනය මත ඔවුන්ට ප්‍රතිජීවක ඖෂධ ලබාදේ. රෝගවලට ගොදුරු වේය යන උපකල්පනය මත ප්‍රතිජීවක ඖෂධ ලබාදීම ඇත්ත වශයෙන් නොකළ යුතු දෙයකි. ප්‍රතිජීවක ඖෂධ අවභාවිතය වෛද්‍ය ක්ෂේත්‍රයේ මෙන්ම අනෙකුත් ක්ෂේත්‍රවලත් සිදුවිය හැකි දෙයකි. මේ සියල්ලම එකට බැඳී ඇත්තේ “වෛද්‍ය ක්ෂ්ත්‍රය, පශු වෛද්‍ය කේෂ්ත්‍රය, කෘෂිකාර්මික ක්ෂ්ත්‍රය” වශයෙනි. One Health Concept තුළ මේ කණ්ඩායම් තුනම සිටී. ප්‍රතිජීවක ඖෂධ අවභාවිතය වළක්වා ගත හැක්කේ ප්‍රධාන කාණ්ඩ තුනම එකතු වුවහොත් පමණි.

ප්‍රතිජීවක ඖෂධ අවභාවිතය මේ අයුරින්ම ගමන් කළහොත් වර්ෂ 2050 පමණ වනවිට ලබාදීමට ප්‍රතිජීවක නොමැති වී යා හැකිය. රෝගියකු බවත් රෝගියාට වැලඳී ඇති රෝගය දැනන් රෝගය ඇතිවී තිබෙන්නේ කුමන විසබීජය නිසා බවද තියෙන නමුත් ප්‍රතිජීවක ඖෂධ නොමැති වීම නිසා රෝගියාට මියයෑමට සිදුවේ. මෙහි ඇති භයානකම තත්ත්වය එයයි. වෛද්‍ය කෙෂ්ත්‍රයේ ප්‍රතිජීවක අවභාවිතය සඳහා කාණ්ඩ කිහිපයක් සම්බන්ධ වේ. වෛද්‍ය කාණ්ඩයේදී ප්‍රතිජීවක ඖෂධ අවභාවිත වන ක්‍රම 3ක් ඇත. ප්‍රතිජීවක ඖෂධ ලබා දීමේදී ‘රෝගියා පිළිබඳව වෛද්‍යවරයකු හොඳින් සොයා බැලිය යුතුය. මේ රෝගියාට රෝගය ආසාදනය වී තිබෙන්නේ වයිරසයක් නිසාද, බැක්ටීරියාවක් නිසාද යන්න සොයා බැලිය යුතුයි. ඒ සඳහා අවශ්‍ය පරීක්ෂණ කිරීම දෙවන පියවරයි. එයින් තවදුරටත් මෙය බැක්ටීරියාවකින් සෑදුණු රෝගයක්ද නැත්නම් වයිරසයකින් සෑදුණු රෝගයක්ද යන්න පිළිබඳව පැහැදිලි කරගනිමි. එසේම තවත් පර්යේෂණයක් තිබේ. එම පර්යේෂණයට දිනක් පමණ ගතවේ. එම පර්යේෂණය මඟින් සත්‍ය වශයෙන් මෙය බැක්ටීරියා ආසාදනයක් නිසාද නැත්නම් වයිරස ආසාදනයක් නිසා යන්න පිළිබඳව තහවුරු කරගැනීමට හැකි වේ. ශ්‍රී ලංකා ක්ෂුද්‍රජීවී විශේෂඥයන්ගේ විද්‍යායතනය විසින් මේ සඳහා අනුගමනය කළ යුතු රාමුවක් හඳුන්වාදී තිබෙන අතර ඔවුන් විසින් එක් එක් රෝගයට නිර්දේශ කළ හැකි බෙහෙත් සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක්ද සකස් කර ඇත. එමඟින් ප්‍රතිජීවක දිගටම ගතයුතුද, එසේත් නැත්නම් නතර කළ යුතුද, එසේ නොමැතිනම් ප්‍රතිජීවක ඖෂධය වෙනස් කළ යුතුද යන්න පිළිබඳවත් අවබෝධයක් ලබාදේ.

ප්‍රතිජීවක ඖෂධ නියම කිරීම කළ යුත්තේ ශ්‍රී ලංකාවේ වෛද්‍ය සභාවේ ලියාපදිංචි වූ සුදුසුකම් ලත් වෛද්‍යවරයෙක් විසිනි. ඔහු වෛද්‍යවරයෙක් හෝ දන්ත වෛද්‍යවරයෙක් විය හැකිය. බෙහෙත් නියම කරන තැනදී නියම ප්‍රතිජීවක ඖෂධයම නිර්දේශ කළ යුතුය. ප්‍රතිජීවක නිර්දේශ කළාට පසුව අප ගමන් කරන්නේ ඖෂධසල් වෙතයි. ඖෂධසල් හිමිකරුවන් විසින් මෙය හරි බෙහෙත් වට්ටෝරුවද, මෙය පරණ බෙහෙත් වට්ටෝරුවද යන්න පිළිබඳව සොයා බැලිය යුතුය. එසේම මට හෙම්බිරිස්සාව තියෙනවා. මට ඖෂධයක් දෙන්න කියලා ජනතාව කරන ඉල්ලීම්වලට ප්‍රතිජීවක ලබාදීම නතර කළ යුතුය.

**සාකච්ඡා කළේ - රුවන් පුෂ්ප කුමාර**
**සන්නිවේදන හා මාධ්‍ය ඒකකය**
**කැලණිය විශ්වවිද්‍යාලය**